**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල - 2019**
**------------------------------------------**

## 1.1 මතය ව්‍යාචනය
**-----------------**

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතේ (621 අධිකාරියේ) 24(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මම මතයක් ප්‍රකාශ නොකරමි. 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 මතය ව්‍යාචනය සඳහා පදනම
**-------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය ව්‍යාචනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමානවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව.

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අරමුදල විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 7 ඡේදය ප්‍රකාරව ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම් ගත කල යුතු වුවද එයට පටහැනිව වාර්ෂික ගිණුම්වල ඇතුලත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.4 (සී) (ii) යටතේ අරමුදලට ලැබෙන මුදල්, මුදල් පදනම මත ගිණුම්ගත කරන බවට හෙළිදරව් කිරීම් කර තිබුණි . | කරුණ සම්බන්ධයෙන් එකඟ වී ඇත. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 1.5.3 පැහැදිලි නොකළ වෙනස්කම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාසික ගිණුම් සාරාංශ මගින් විවිධ රාජ්‍ය ආයතන විසින් අරමුදලේ බැංකු ගිණුමට සිදුකරන ලද හර හා බැර කිරීම් වලින් හඳුනා නොගත් ශේෂ නිරවුල් කරන තෙක් ගැලපුම් | 2019 දෙසැම්බර් 31 දිනට සාවද්‍ය හර උපලේඛණයට අනුව ශේෂය 24,517,312 ක් වන අතර වසර 1 සිට 3 දක්වා රු. 641,083 ක් ද වසර 4 සිට 6 දක්වා රු. 22,205,371 ක් ද වසර 7 සිට 10 දක්වා රු. 1,543,715 ක් ද වසර 11 ට වැඩි රු. 127,142 ක ශේෂයක් ද පෙන්නුම් කරනු ලබයි. | වාර්ෂිකව ගැලපුම් ගිණුමේ ශේෂ වෙන වෙනම අදාල ආයතන සමඟ සැසඳුම් කර නිවැරදි ගිණුම්වලට ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වීම. |

| | |
|---|---|
| ගිණුමකට ඇතුළත් කර තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ හර ශේෂය රු.29,807,957 ක් වුවද, ඊට අදාල උපලේඛනය අනුව ශේෂය රු.24,517,312 ක් වුයෙන් රු.5,290,644 ක වෙනසක් නිරීක්ෂණය විය. | ආයතන වෙත වරින් වර ලිපි මඟින් හර ශේෂ නිරවුල් කරන ලෙස දැනුම් දෙන අතර, බොහෝ ආයතන යහපත් ප්‍රතිචාර නොදක්වයි. මේ පිළිබද කළමනාකරණ කමිටුවේ ද අවධානයට යොමු කර ඇති අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හරහා මේ පිළිබඳව ක්‍රම වේදයක් අනුගමනය කිරීමටද අවධානය යොමු කර ඇත. මෙම ශේෂ සනාථ කිරීම සඳහා අරමුදල පවත්වා ගෙන යන උපලේඛනයේ වසර ගණනාවක පෙර සිට අගයක් පෙන්නුම් කරන අතර එය අපගේ ගැලපුම් ගිණුමේ ආරම්භක ශේෂය හා නොගැලපේ .මෙම ශේෂ නිරවුල් වී ඇද්ද යන්න පිළිබද තොරතුරු නොමැති වීම නිසා නිවැරදි නොකල හර ශේෂ යටතේ තවමත් දක්වා ඇති අතර අදාල තොරතුරු සොයා ගැනීමට අඛණ්ඩව කටයුතු කෙරේ. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අනිවාර්යා දායක මුදල් ගිණුම, ස්වේච්ඡාදායක මුදල් ගිණුම, රජයේ දායක මුදල් ගිණුම | 68,246,168,683 | අරමුදලේ දායකයින් ගේ තොරතුරු පවත්වාගෙන යාම සඳහා මාර්ගගත දත්ත පද්ධතියක් හදුන්වා දී තිබුණද එය විමත් පරිදි ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ශේෂ පත්‍රයේ දක්වා තිබූ දායක මුදල් ගිණුමේ ශේෂ සම්බන්ධයෙන් කේවල ගිණුම් පවත්වාගෙන ගොස් නොතිබීම. | රාජ්‍ය සේවා අරමුදලට 8% හා 12% ලෙස එක් එක් ආයතන මඟින් එවන ලද මුදල් ලැබීම් ලේඛනයේත් 8% හා 12%ලෙස ගෙවීම් වෙන් කර ගෙවීම් ලේඛනයේත් සටහන් කරනු ලබයි .වර්ෂයේ ආරම්භක ශේෂයට වර්ෂය තුළ ලැබීම් වලින් ගෙවීම් අඩු කර වර්ෂයේ ලාභ විසර්ජනයන් එකතු කිරීමෙන් අනිවාර්ය දායක මුදල් ගිණුමේ රජයේ දායක මුදල් ගිණුම් හා ස්වේච්ඡා දායක මුදල් ගිණුමේ ශේෂය ගණනය කර ඇත. | අරමුදල යටතේ දායක වී ඇති දායකයින්ගේ කේවල ගිණුම් පිළිබඳ විධිමත් දත්ත පද්ධතියක් පවත්වා ගැනිම මඟින් ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කර ගත යුතු වීම. |

**1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1942 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතේ (621 අධිකාරය) | | | |
| (i) 16 (ආ) සහ 20 (ආ) වගන්ති | අකාර්යක්ෂමභාවය, විෂමාචාරය යන හේතුව මත දායකයකු සේවයෙන් පහ කරනු ලබන විට හෝ අරමුදලේ දායකයකු රාජ්‍ය සේවයෙහි විශ්‍රාම වැටුප් හිමි ධූරයකට පත්කරනු ලැබූ විට රජයේ ප්‍රසාද මුදල් සම්බන්ධයෙන් ලැබුණු පොලියත් සමඟ ඒ දායකයාගේ ගිණුමට ආණ්ඩුව විසින් බැර කරන ලද ප්‍රසාද මුදල් ප්‍රමාණය අරමුදලින් ඒකාබද්ධ අරමුදලට නැවත ගෙවිය යුතු වුවත් 2019 වර්ෂයට අදාල රු. 318,660,995 ක් නොගෙවූ රජයේ ප්‍රසාද මුදල් හා පොලිය උපචිතව පැවතුණි . | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනතේ 20 හා 16 වගන්ති යටතේ ගෙවිය යුතු රජයේ දායක මුදල හා ඊට අදාළ පොලිය 2018 වර්ෂය දක්වා නිරවුල් කර ඇත. 2019 වර්ෂයේදී ගෙවිය යුතු මුදල 2020 වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කෙරේ. | නොගෙවූ රජයේ දායක මුදල් හා පොළිය ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) 25 වගන්තිය | එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දෙසැම්බර් 31 දිනට සාමාජික ගිණුම්වල ඇති ශේෂයන් දායකයින් වෙත දැනුම් දිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය සේවා අර්ථසාධක අංශය සඳහා තොරතුරු පද්ධතියක් හඳුන්වා දීම පිළිබඳ අවධානය යොමු වී ඇති අතර දැනටත් සාමාජික අංක ලියාපදිංචිය මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කරනු ලැබේ. නවක සාමාජික ගිණුම් ශේෂ දෙසැම්බර් 31 දිනට දැන්වීම සඳහා ක්‍රමවේදයක් නිර්මාණය කිරීමට විවිධ ප්‍රයෝගික ගැටළු හේතුවෙන් ප්‍රමාද වී ඇත. 2/2017 චක්‍රලේඛයට අනුව ආයතන විසින් සාමාජිකයන්ගේ වෙක්පත් විස්තර පද්ධතියට ඇතුළත් කලයුතු වුවත්, ආයතන විසින් තම අභිමතය පරිදි සකසා ගත් ආකෘතියකින් එම විස්තර එවීමට | පනතේ වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

මේ තාක් කටයුතු කර ඇත. එබැවින් ආයතන මෙම ක්‍රියාවලිය සඳහා ප්‍රායෝගිකව සහභාගී කරවා ගැනීමට දැනුවත් කිරීමේ ලිපි මඟින් ඍජුවම උපදෙස් ලබා දී ඇත.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 6,520,628,550 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 6,779,940,754 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 259,312,204 ක අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම අඩුවීමට අයෝජන මත පොළී ආදායම් රු. 257,693,038 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 ජනවාරි 01 දිනට නොගෙවූ අයදුම්පත් 592 ක් තිබූ අතර වර්ෂය තුල අරමුදලේ සාමාජිකයින් විසින් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ඉදිරිපත් කල අයදුම්පත්‍ර සංඛ්‍යාව 6,435 ක් විය. ඒ අතුරින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයදුම්පත් 5,070 ක් සඳහා රු. 708,893,693 ක් ගෙවීම් කර තිබූ අතර අයදුම්පත් 434 ක් ප්‍රතික්ෂේප කර තිබුණි. | 2019 වර්ෂය තුළ ගෙවීම් කිරීම සඳහා අයදුම්පත්‍ර 6435 ක් ලැබී තිබුණ අතර ඒයින් 5070 ක් සඳහා ගෙවීම් කර ඇත. වසරේ ජූලි - ඔක්තෝබර් දක්වා අයදුම්පත්‍ර 700 කට ආසන්න ප්‍රමාණයක් එක් මසක් තුළදී ලැබී ඇත. මෙලෙස මුළු අයදුම්පත් ප්‍රමාණය 6000 ඉක්මවා ගියද ආයතනයේ ගෙවීම් ලිපිගොණු සැකසීමට අනුයුක්ත කර සිටි නිලධාරින්ගේ වර්ධනයක් සිදු නොවීය. මෙම අයදුම්පත් අතර අඩුපාඩු කැඳවීම සඳහා ලිපි යවන ලද අයදුම්පත්ද ඇතුලත් වේ.එබැවින් ප්‍රතිලාභ ලබා ගැනීමට ඉදිරිපත් වන ලිපි ගොණුවල පවතින අඩුපාඩු මත සියළුම අයදුම්පත්‍ර සඳහා එකවර ගෙවීම් කල නොහැක.කෙසේ වුවද අංශය වෙත ලැබෙන අයදුම්පත් සංඛ්‍යාවට සාපේක්ෂව සිදුකරනු ලබන ගෙවීම් සංඛ්‍යාව උපරිමය දක්වා වර්ධනය කර ගැනීම සඳහා මේ වන විට අවශ්‍යය පියවර ගෙන ඇත. | ආයතනවලින් ලැබෙන අයදුම්පත්වල පවතින අඩුපාඩු අවමකර ගැනීමට උපදෙස් ලබාදීමට කටයුතු කිරීම තුලින් අයදුම්පත් සඳහා නොපමාව ගෙවීමට කටයුතු කළ යුතු වීම. |